# ලස්සන ගෙවත්තක් සවිමත් ආර්ථිකයක්



කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

# වම්බටු



**බිම් සැකසීම**

වල් පැළෑටි ඉවත්කර පස හොඳින් බුරුල්කර සියුම්ව සකසා සෙ.මී 30 x සෙ.මී 30 ක් පමණ වූ වලවල් සකසා ගන්න. පැළ සිටුවීමට දින 2-3 කට පෙර දෝත් 3-4 ක් දිරූ කාබනික පොහොර පස් සමඟ මිශ්‍ර කර වලවල් පුරවන්න.

**පරතරය**

පේළි අතර - සෙ.මී. 90
පේළිය තුළ, පැළ අතර - සෙ.මී. 60

**බීජ/පැළ සිටුවීම**

දින 25-30 ක් වයසැති තවාන් පැළ එක් වලක දෙක බැගින්, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න.

**රසායනික පොහොර**

**මූලික පොහොර** යූරියා කොටස් 01ක්, සාන්ද්‍ර සුපර් පොස්පේට් කොටස් 4 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1ක් මිශ්‍රකර ගිනි පෙට්ටි පියන් 2 ක් වලකට දමා මිශ්‍ර කරන්න.

**මතුපිට පොහොර**

සිටුවා සති 4 හා 8 දී යූරියා ගිනිපෙට්ටි පියන් 1 ක් වලකට යොදන්න. මාසයකට වරක් වාර 03 ක් පමණ යූරියා කොටස් 01 ක් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 01 මිශ්‍රකර ගිනිපෙට්ටි පියන් 1 බැගින් වලකට යොදන්න.

**පුහුණු කිරීම/ නඩත්තුව**

ප්‍රධාන කඳේ පහලින් එන අතු ඉවත් කරන්න.

**අස්වැන්න**

මාස 2-2 1/2 කින් පමණ අස්වනු නෙළීම ආරම්භ කළ හැක.

**පෝෂණ ගුණය**

විටමින් බී සහ කෙඳි බහුලයි

# බණ්ඩක්කා



**බිම් සැකසීම**

වල් පැළෑටි ඉවත්කර පස හොඳින් බුරුල්කර සියුම්ව සකසා සෙ.මී 30 x සෙ.මී 30 ක් පමණ වූ වලවල් සකසා ගන්න. බීජ සිටුවීමට දින 2-3 කට පෙර දෝත් 3-4 ක් දිරූ කාබනික පොහොර පස් සමඟ මිශ්‍ර කර වලවල් පුරවන්න.

**පරතරය**

පේළි අතර - සෙ.මී 90
පේළිය තුළ, පැළ අතර - සෙ.මී 60

**බීජ/පැළ සිටුවීම**

එක් වලක සෙ. මී 2-3 ගැඹුරින් බීජ 3-4 බැගින් සිටුවන්න. බීජ පැළවී සති 2 කින් එක් වලක පැළ 2 ක් ඉතිරි කර වැඩි පැළ ඉවත් කරන්න.

**රසායනික පොහොර**

**මූලික පොහොර**

බීජ හෝ පැළ සිටුවීමට දින 2-3 කට පෙර වලවල්වලට මිශ්‍ර කරන්න. යූරියා කොටස් 01ක්, සාන්ද්‍ර සුපර් පොස්පේට් කොටස් 3 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1ක් සමඟ මිශ්‍ර කර ගිනි පෙට්ටි පියන් 1 ක් පමණ එක් වලකට දමා පසට හොඳින් මිශ්‍ර කරන්න.

**මතුපිට පොහොර**

සති 4 හා 7 දී පමණ යොදන්න. යූරියා කොටස් 01ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1ක් සමඟ මිශ්‍ර කර, ගිනි පෙට්ටි පියන් 1 ක් පැළය වටා යොදා පසට මිශ්‍ර කරන්න.

**පුහුණු කිරීම/ නඩත්තුව**

අස්වනු නෙලන විට පහල පත්‍ර කපා ඉවත් කරන්න.

**අස්වැන්න**

පළමු අස්වැන්න මාස 2 කදී පමණ ලබා ගත හැක.

**පෝෂණ ගුණය**

කැල්සියම්, අයඩින් සහ විටමින් සී බහුල එළවළුවකි.

# දඹල



**බිම් සැකසීම**

වල් පැළෑටි ඉවත්කර පස හොඳින් බුරුල්කර සියුම්ව සකසා සෙ.මී 30 x සෙ.මී 30 ක් පමණ වූ වලවල් සකසා ගන්න. බීජ සිටුවීමට දින 2-3 කට පෙර දෝත් 3-4 ක් දිරූ කාබනික පොහොර පස් සමඟ මිශ්‍ර කර වලවල් පුරවන්න.

**පරතරය**

පේළි අතර - සෙ.මී. 75
පේළිය තුළ, පැළ අතර - සෙ.මී. 60

**බීජ/පැළ සිටුවීම**

එක් වලක බීජ 1-2 ක් සිටුවන්න.

**රසායනික පොහොර**

**මූලික පොහොර**

බීජ සිටුවීමට දින 2 - 3 කට පෙර සකසාගත් වලවල්වලට මිශ්‍ර කරන්න. යූරියා කොටස් 1 ක්, සාන්ද්‍ර සුපර් පොස්පේට් කොටස් 3 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1 ක් සමඟ මිශ්‍ර කර වලවල් 3 කට ගිනි පෙට්ටි පියන් 1 ක් යොදන්න.

**මතුපිට පොහොර**

බීජ සිටුවා සති 3 සහ 5 කින් යොදන්න. යූරියා කොටස් 1 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1 ක් සමඟ මිශ්‍ර කර එම මිශ්‍රණයෙන් පිරවූ ගිනි පෙට්ටි පියන් 1 ක් වලවල් 3 කට පමණ වන සේ යොදන්න.

**පුහුණු කිරීම/ නඩත්තුව**

සෑම වැලක්ම කෝටුවකට හෝ ඉපලකට යොමු කරන්න. වැල්වලට මීටර 2 ක් පමණ උස කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇදීම ද කළ හැක.

**අස්වැන්න**

දින 90 කදී පමණ අස්වනු නෙළීම ආරම්භ කළ හැකිය.

**පෝෂණ ගුණය**

ප්‍රෝටීන්, විටමින් සී සහ දල තන්තු බහුල එළවළුවකි.

# මාළුමිරිස්



**බිම් සැකසීම**

වල් පැළෑටි ඉවත්කර පස හොඳින් බුරුල්කර සියුම්ව සකසා සෙ.මී 30 x සෙ.මී 30 ක් පමණ වූ වලවල් සකසා ගන්න. පැළ සිටුවීමට දින 2-3 කට පෙර දෝත් 3-4 ක් දිරූ කාබනික පොහොර පස් සමඟ මිශ්‍ර කර වලවල් පුරවන්න.

**පරතරය**

පේළි අතර - සෙ.මී. 40
පේළිය තුළ, පැළ අතර - සෙ.මී. 40

**බීජ/පැළ සිටුවීම**

දින 25-30 ක් වයසැති තවාන් පැළ එක් වලක 2 බැගින් මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා, ජලය සපයා, සෙවන කරන්න.

**රසායනික පොහොර**

**මූලික පොහොර**

පැළ සිටුවීමට දින 2 - 3 කට පෙර පසට මිශ්‍ර කරන්න. යූරියා කොටස් 2 සාන්ද්‍ර සුපර් පොස්පේට් කොටස් 3 ක් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1 ක් සමඟ මිශ්‍ර කරන්න. ඉන් ගිනිපෙට්ටි පියන් 1 ක් වලකට මිශ්‍ර කරන්න.

**මතුපිට පොහොර**

යූරියා කොටස් 2 ක් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1 ක් මිශ්‍ර කරන්න. සිටුවා සති 4 දී ගිනි පෙට්ටි පියන් 1ක් වලකට මිශ්‍ර කරන්න.

**පුහුණු කිරීම/ නඩත්තුව**

පැළ වර්ධනය වීමත් සමඟ පස් ලන් කරන්න.

**අස්වැන්න**

සිටුවා දින 75 පමණ පලමු අස්වැන්න නෙලාගත හැකිය.

**පෝෂණ ගුණය**

විටමින් A හා C අඩංගු එළවළුවකි.

# නිවිති



**බිම් සැකසීම**

වල් පැළෑටි ඉවත්කර පස හොඳින් බුරුල්කර සියුම්ව සකසා සෙ.මී 30 x සෙ.මී 30 ක් පමණ වූ වලවල් සකසා ගන්න. බීජ සිටුවීමට දින 2-3 කට පෙර දෝත් 3-4 ක් දිරූ කාබනික පොහොර පස් සමඟ මිශ්‍ර කර වලවල් පුරවන්න.

**පරතරය**

පේළි අතර - සෙ.මී. 45
පේළිය තුළ, පැළ අතර - සෙ.මී. 45

**බීජ/පැළ සිටුවීම**

එක් වලක බීජ 2ක් සිටුවන්න.

**රසායනික පොහොර**

**මූලික පොහොර**

බීජ සිටුවීමට දින 2 - 3 කට පෙර සකසාගත් වලවල්වලට මිශ්‍ර කරන්න. යූරියා කොටස් 1 ක්, සාන්ද්‍ර සුපර් පොස්පේට් කොටස් 3 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1 ක් සමඟ මිශ්‍ර කර වලවල් 3 කට ගිනි පෙට්ටි පියන් 1 ක් යොදන්න.

**මතුපිට පොහොර**

බීජ සිටුවා සති 3 සහ 5 කින් යොදන්න. යූරියා කොටස් 1 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් කොටස් 1 ක් සමඟ මිශ්‍ර කර එම මිශ්‍රණයෙන් පිරවූ ගිනි පෙට්ටි පියන් 1 ක් වලවල් 3 කට පමණ වන සේ යොදන්න.

**පුහුණු කිරීම/ නඩත්තුව**

සිටුවා සති 4ක් පමණ ගතවූ පසු පොලොව මට්ටමේ සිට අඩි 1-1 1/2 උසින් සිටින සේ පාත්තියට ඉහළින් මැස්සක් සකසා ගන්න.

**අස්වැන්න**

දින 45 කින් පසු වරින් වර අස්වනු ලබා ගත හැක.

**පෝෂණ ගුණය**

විටමින් A යකඩ සහ දල තන්තු බහුල එළවළුවකි.

## ගෙවතු වගාවේදී වැදගත් වන පොදු කරුණු කීපයක්

- බීජ හැකි ඉක්මනින් ක්ෂේත්‍රයේ සිටුවන්න. තද වැසි කාලයේ සිටුවීමෙන් වළකින්න. සුදුසු කාලයක් හෝ කල් තබා ගැනීමට අවශ්‍ය වේ නම් වියලි සිසිල් ස්ථානයක තබන්න.

- සෑමවිටම හොඳින් දිරූ කාබනික පොහොර වැඩි ප්‍රමාණයක් බෝග සිටුවීමට පෙර බිම් සැකසීමේදී පසට එකතු කර මිශ්‍ර කරන්න

- රසායනික පොහොර යෙදීමේදී පැළයේ පාමුලටම යෙදීමෙන් වලකින්න.

- පසේ තෙතමනය නිසි ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී ජලය සපයන්න.

- වගාව වල් පැළෑටිවලින් තොරව තබා ගන්න.

- පසේ තෙතමනය ආරක්ෂා කර ගැනීම සඳහාත්, වල් පැළෑටි මර්ධනය සඳහාත් වියළි පිදුරු, තණකොළ වැනි වසුන්වලින් වගාවේ පස ආවරණය කරන්න.

- පළිබෝධ හානි අවම කර ගැනීම සඳහා වගාව පිරිසිදුව තබා ගන්න. නිතර වගාව පරීක්ෂා කර හානි සහිත කොටස් හෝ පළිබෝධකයින් ඇත්නම් එකතු කර විනාශ කරන්න.









# ලස්සන ගෙවත්තක් - සවිමත් ආර්ථිකයක්

සකසුරුවම ඇතිවිය යුත්තේ ඔබ තුළමයි. එය එක්තරා ආකාරයක පුරුද්දකි. හොඳ පුරුදු ජීවිතයට එක්කර ගැනීමට අප ප්‍රමාද විය යුතු නැහැ. එබැවින් සකසුරුවම නම් **"හොඳ පුරුද්ද"** ඔබේ ජීවිතයට අදම එකතු කරගන්න. ගෙවතු වගාව ඔස්සේ ඔබේ ගෙවත්ත උපරිම ප්‍රයෝජන ලැබෙන අයුරින් භාවිත කිරීමට ඉඩ සැලසෙනවා. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මේ වෑයම ගෙවතු වගාවෙන් සකසුරුවමට ඉඩ විවර කර ඔබටත් රටටත් සවිමත් ආර්ථික පදනමක් නිර්මාණය කිරීමයි.

## ගෙවතු වගාවෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ

- **ආර්ථික ප්‍රතිලාභ**

ගෙවතු වගාවෙන් ඔබගේ දෛනික එළවළු සහ පලතුරු අවශ්‍යතාව සපුරා ගතහැක. මෙමඟින් ඔබගේ මුදල් මෙන්ම කාලය ද ඉතිරි කරයි.

- **සෞඛ්‍ය ප්‍රතිලාභ**

වස විස නැති එළවළු සහ පළතුරුවලින් පිරි ගෙවත්තක් නිර්මාණය කර ගතහැකි අතර නැවුම් එළවළු සහ පලතුරු පරිභෝජනය නිරෝගීමත් දිවියකට මඟ පාදයි.

- **පාරිසරික ප්‍රතිලාභ**

ගෙවතු වගාව පරිසරය සුරැකීමට දායක වන අතර, ඔබේ ගෙවත්තේ කොම්පෝස්ට් බඳුනක් සාදා ගැනීමෙන් ඔබට අපද්‍රව්‍ය කළමණාකරනයට ද දායක විය හැක.

- **ආත්ම තෘප්තිය**

ඔබේ ගෙවත්තේ වැඩෙන ගහ කොළ මල් හා එලදාව දැකීමෙන් ඔබට නිම් හිම් නැති සතුටක් ලැබෙන අතර එය මානසික ආතතිය අඩු කර ගැනීමට ද මඟ පාදයි. එමඟින් බෝ නොවන රෝග ද වළක්වා ගත හැකිය.

- **සුන්දර වටපිටාව**

ලස්සන ගෙවත්තක් නිවසේ වටපිටාව අලංකාරවත් කරයි.

- **ලස්සන විනෝදාංශයක්**

පවුලේ විනෝදාංශයක් ලෙස ගෙවතු වගාව යොදාගත හැකි අතර එමඟින් පවුලේ සමඟිය ද තහවුරු වේ.